# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2122/44 – 2019 මැයි 09 වැනි බ්‍රහස්පතින්දා – 2019.05.09**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

*මගේ අංකය*: IR/10/63/2013.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරිය**

131 වන අධිකාරිය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2016.10.07 දිනැති හා අංක 1987/43 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2016.10.05 දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් මීගොඩ, පුවක්ගහහේන, අංක 305/13 හි පදිංචි අයි. එස්. එස්. පෙරේරා මයා හා අනෙක් පාර්ශවය වශයෙන් කොළඹ 02, වොක්ෂොල් වීදිය, අංක 27, සතොස මහලේකම් ගොඩනැගිල්ලෙහි පිහිටි සමුපකාර තොග වෙළඳ සංස්ථාව අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2019.02.21 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 මැයි මස 06 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුව.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## කාර්මික අධිකරණයේ දී ය.

අයි. එස්. එස්. පෙරේරා
305/13,
මීගොඩ

*පළමු පාර්ශවයේ ඉල්ලුම්කරු.*

A 3670
IR/10/63/2013.

*එරෙහිව*

සමුපකාර තොග වෙළඳ සංස්ථාව,
සතොස මහ ලේකම් ගොඩනැගිල්ල,
27, වෝක්ෂෝල් වීදිය,
කොළඹ 02

*දෙවන පාර්ශවයේ වගඋත්තරකරු.*

යන දෙපාර්ශවයේ ආරවුල සම්බන්ධ ප්‍රදානයයි.

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය වේලාතන්ත්‍රිගේ දොන් ජෝන් සෙනවිරත්න ගරු අමාත්‍යතුමා 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියේ තමා වෙත පැවරී ඇති බලතල අනුව ඉහත කී දෙපාර්ශවය තුළ කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද එකී ආරවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් 2016.10.25 දින මා පත් කොට මා වෙත යොමු කොට ඇත.

ඉහත දෙපාර්ශවය අතර පවත්නා කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ :-

''සමුපකාර තොග වෙළඳ සංස්ථාවේ 01 වන ශ්‍රේණියේ තත්ත්ව ආරක්ෂක නිලධාරියෙකු ලෙස සේවය කළ අයි. එස්. එස්. පෙරේරා මහතා වැඩ තහනමකට ලක්ව සිටි 2002.11.27 දින සිට 2005.02.18 දින දක්වා කාලයට ඔහුට වැටුප් ලබා දෙන ලෙසට කරුණු ලබන ඉල්ලීම යුක්ති සහගත ද යන්න හා එලෙස යුක්ති සහගත වේ නම් ඔහුට හිමි විය යුතු සහනයන් කවරේ ද යන්න පිළිබඳව වේ.''

***බේරුම්කරණ ක්‍රියා පටිපාටිය*** :-

විභාගය ආරම්භ කිරීමට ප්‍රථම දෙපාර්ශවයෙන්ම ලිඛිත සැලකිරීම්, කැඳවීම සහ දෙපාර්ශවයෙන් ඉල්ලුම්කාර පක්ෂයට ප්‍රථමයෙන් විභාගය ආරම්භ කිරීමට ඉඩ සලසා දෙන ලදී.

විස්තර ප්‍රකාශ දෙපාර්ශවය අතර හුවමාරු කිරීමට ඉඩ සැලසීමෙන් පසුව විභාගය ආරම්භ කිරීම සඳහා නියෝග කළෙන් ඊට පෙර යොමුව සම්බන්ධයෙන් යම් සමථයක් වෙත් නම් එය අධිකරණයට දන්වන ලෙස 2017.03.16 දින දෙපාර්ශවයට දන්වන ලදී.

***බේරුම්කරණ ක්‍රියා පටිපාටිය*** :-

2017.03.16 දින විභාගයට කැඳවන ලද්දෙන් ඉල්ලුම්කරු සහ ඔහු වෙනුවෙන් නියෝජිත ග්‍රේෂන් සිල්වා මහතා ද, වගඋත්තරකාර පාර්ශවය නියෝජනය කරමින් ආයතනයේ උසාවි නිලධාරි කේ. ඒ. මහේෂ් මහතා පෙනී සිටියේ ය. වගඋත්තරකරුගේ නීති නිලධාරි ප්‍රදීපිකා ලක්මාලි ජයසිංහ මිය බේරුම්කරණ විභාගයට සහභාගී වූවා ය.

***ඉල්ලුම්කරුගේ ස්ථාවරය*** :-

01. 1972.04.01 සිට තමා සමුපකාර තොග වෙළඳ සංස්ථාවේ iii ශ්‍රේණියේ රසායනාගාර සහකාරවරයෙකු ලෙස සේවයට බැඳුණු බවත්,

02. 1983 වසරේ දී තත්ත්ව පරීක්ෂණ සහකාර ii ශ්‍රේණියට ද, 1998 දී තත්ත්ව ආරක්ෂණ සහකාර ලෙස ද උසස් වීම් ලැබූ බව,

03. ධාන්‍ය මිලදී ගැනීමේ දී දිවයින පුරා ගොස් මිල දී ගන්නා ධාන්‍ය හොඳ තත්ත්වයේ පවතී දැයි පරීක්ෂා කිරීම තමා සතු රාජකාරි බව ද,

04. 1998.03.04 හා 1998.12.31 දක්වා අතරතුර මුතුකණ්ඩිය වී ගැනුම් මධ්‍යස්ථානයේ රු. 194,578.00 ක වී අඩුමානයක් සම්බන්ධයෙන් 50% ක වගකීමක් තමා වෙත පවරා එම මුදල ගෙවන ලෙස 2002.03.05 දින දන්වා තිබූ බව ද,

05. එම මුදල නොගෙවීම මත 2002.11.27 තමා වැඩ තහනමට ලක් වූ බව,

06. එකී කරුණ සම්බන්ධයෙන් විනය පරීක්ෂණයක් පැවැත්වූ බව ද,

07. විනය පරීක්ෂණය සම්බන්ධයෙන් තමා නිදොස් කොට නිදහස් වූ බව ද,

08. වැඩ තහනමට ලක් ව සිටි කාලය සඳහා හිඟ වැටුප් ගෙවීමකින් තොරව සේවයට බඳවා ගත් බව ද,

09. තමාට හිඟ වැටුප් අවස්ථා කීපයකදීම ඉල්ලා සිටියද එය ඉටු නොවූ බව,

10. මුතුකණ්ඩිය ආයතනයේ තමා සමග වැඩ තහනමට ... අනෙක් නිලධාරියෙකුහට කම්කරු විනිශ්චය සභාවක් මඟින් රු. 136,890.00 ක මුදලක් ගෙවීමට ආයතනයට සිදු වීමෙන්

11. එලෙස තමා ද කම්කරු කාර්යාලයට පැමිණිල්ලක් ගොනු කළ බව ද,
ඉල්ලුම්කරු ප්‍රකාශ කර ඇත.

*වගඋත්තරකාර දෙවන පාර්ශවයේ ස්ථාවරය* :-

01. විනය ලිපි ගොනුව අස්ථාන ගතව ඇති බව,

02. වී තොග අඩුමානයක් සම්බන්ධයෙන් වැඩ තහනමට ඉල්ලුම්කරු ලක්ව සිටි බව,

03. වැඩ තහනමට ලක්ව සිටි කාලය සඳහා හිඟ වැටුප් රහිතව නැවත සේවයට කැඳවා ඇති බව,

04 සේවයට වාර්තා කිරීමෙන් පසුව 2007.10.11 දින දක්වා සේවයේ යෙදී සිට විශ්‍රාම ගන්වා ඇති බවත්, 2007.11.12 දින රු. 309,668.00 ක පාරිතෝෂික මුදලක් ගෙවූ බවත් වගඋත්තරකරු සඳහන් කරයි.

*බේරුම්කරණ ක්‍රියා පටිපාටිය* :-

2017.02.03 බේරුම්කරණ විභාගය සඳහා දෙපාර්ශවය කැඳවන ලදී. ඉල්ලුම්කරු එදින විභාගයට පෙනී සිටි නමුත් වගඋත්තරකාර පාර්ශවය වෙනුවෙන් නියෝජනයක් හෝ පෙනී සිටීමක් නොවීය. නැවත කැඳවන ලද 2017.02.16 දිනයේ මෙම බේරුම්කරණ විභාගය සම්බන්ධයෙන් යම් සමථයක් වෙත් නම් හෝ වගඋත්තරකාර පාර්ශවයේ පෙනී සිටීමක් නොවන්නේ නම් ඊළඟ දිනයේ නඩුව ඒක පාර්ශවිකව සිදුකරන බව ලේඛන ගත තැපෑලෙන් දන්වන ලදී.

ඒ අනුව 2017.03.16 වන ඊළඟ නඩු දිනයේ පාර්ශවයන් පැමිණ සිටියෙන් ඉල්ලුම්කාර පාර්ශවය වෙනුවෙන් සමථයක් වන්නේ නම් රු. 307,500.00 ක මුදලක් ඉල්ලුම්කරුට වගඋත්තරකාර පාර්ශවයෙන් ලබා දිය යුතු බවත්, එසේ සමථයක් සිදු නොවන්නේ නම් ඉල්ලුම්කරුට වගඋත්තරකරුගෙන් පහත දීමනා ලැබීමට හිමිකම් පවත්නා බවත් ය.

(අ) වාර්ෂික වැටුප් වැඩි වීම්.

(ආ) රජය විසින් වරින් වර වැඩි කළ දීමනා.

(ඇ) සේවක අර්ථ සාධක අරමුදල සඳහා 20% ක දායක මුදල

(ඈ) සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට දායක විය යුතු 3% දීමනාව.

(ඉ) විශ්‍රාම පාරිතෝෂිකය ගෙවීමේ දී නියමිත වැටුප එනම් වැටුප් වර්ධක නොසලකා ගණනය කර ඇති මුදලේ හිඟය ආදියයි.

*ඉල්ලුම්කරු ප්‍රතිඥා දී තම නඩුව ආරම්භ කරමින් ;*

01. තමන්ගේ මුල් පත්වීම සම්බන්ධයෙන් ද,

02. තමාගේ සේවය තහනම් කිරීම සම්බන්ධයෙන් ද, A - 01 හා A - 02 දරන ලේඛන ඉදිරිපත් කර සිටී.

03. A - 03 චෝදනා පත්‍රය මඟින් චෝදනා පත්‍රය ගැනත්,

04. A - 04 ලේඛනය මඟින් නැවත සේවයේ පිහිටුවීම ද,

05. නැවත සේවය භාර ගැනීම (A - 05 ලේඛනය) ඉදිරිපත් කොට එම විභාග දිනයේ විභාග කටයුතු අවසන් කරන ලදී.

මෙසේ පවත්නා අතරතුර 2017.12.14 දින ඉල්ලුම්කරු විසින් ලියාපදිංචි තැපැල් අංක 6991 යටතේ බේරුම්කරණයේ ලේඛකාධිකාරී තැන වෙත තම A3670 දරන බේරුම්කරණ විභාගය සම්බන්ධයෙන් දෙපාර්ශවය සමථයකට එළඹී බව දන්වා සිටියෙන් ඊළඟ නඩු දිනය වූ 2018.02.21 දින සමථ කොන්දේසි ලේඛනගත කරන ලදී.

එනම් මෙම නඩුවේ ඉල්ලුම්කරු හා වගඋත්තරකාර සමුපකාර තොග වෙළඳ සංස්ථාව 2018.01.03 දින පූර්ණ හා අවසානාත්මක ලෙස සමථයක් ඇති කර ගන්නා ලද බවත්, එකී සමථය පරිදි ඉල්ලුම්කරු වෙත 2017.12.29 දිනැති අංක 912290 දරන කොමර්ෂල් බැංකුවේ විදේශීය ශාඛාවේ චෙක් පතකින් ඉල්ලුම්කරු වෙත රුපියල් දෙලක්ෂයක (රු.2,00,000.00) මුදලක් ගෙවූ බවත්, එකී ගෙවීම පූර්ණ හා අවසානාත්මක ආකාරයෙන් ගෙවන බවත් වගඋත්තරකාර ආයතනයේ නීති නිලධාරිනී ලක්මාලි ජයසිංහ මහත්මිය ප්‍රකාශ කළෙන් මෙම බේරුම්කරණ විභාගය අවසානයට පත්විය.

මෙම තීරණය සාධාරණ හා යුක්ති සහගත තීරණයක් බැව් සහතික කරමි.

**එස්. කාරියවසම්,**
බේරුම්කරු.

2019 පෙබරවාරි මස 21 වැනි දින,
කාර්මික අධිකරණයේ දී ය.

05-588

---

මගේ අංකය: අයිආර්/10/48/2010.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2012.08.30 දිනැති හා අංක 1773/39 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2012.08.09 දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් අතුරුගිරිය, ඔරුවල, සදිසිපුර, අංක 205 හි පදිංචි පී. පී. වැන්දබෝනා මයා හා අනෙක් පාර්ශවය වශයෙන් කොළඹ 02, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, අංක 50 හි පිහිටි ලංකා විදුලිබල මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2019.03.29 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 මැයි මස 06 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

## කාර්මික අධිකරණයේ දී ය

පී. පී. වැන්දබෝනා,
අංක 205,
සදිසිපුර,
ඕරුවල,
අතුරුගිරිය.

සහ

*නඩු අංකය: ඒ.3473*

ලංකා විදුලිබල මණ්ඩලය,
අංක 50, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩ්නර් මාවත,
කොළඹ 02.

අතර කාර්මික ආරවුල.

### *ප්‍රදානයයි*

1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් පැවරී ඇති බලතල අනුව ඉහත නම් සඳහන් පාර්ශවකරුවන් අතර ඇති කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා කම්කරු හා කම්කරු සබඳතා ඇමතිවරයා විසින් 2012.08.09 වන දින මා වෙත යොමු කරන ලදී.

මෙම නඩුවට ගොනු කර ඇති කම්කරු කොමසාරිස්ගේ අංක IR/10/48/2010 ලේඛනය අනුව ඉහත පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ ලංකා විදුලිබල මණ්ඩලයේ 11 'අ' ඛණ්ඩයේ පාරිභෝගික සේවා සහායකවරයෙකු ලෙස සේවය කරනු ලබන පී. පී. වැන්දබෝනා මහතා වෙත 2009.01.30 දින ඉදිරිපත් කර ඇති චෝදනා පත්‍රයේ සඳහන් චෝදනා හයම ඔප්පු නොවී තිබිය දී, දී ඇති විනය නියෝගය පරිදි ඔහුගේ තනතුර පහත හෙළීම හා වැඩ තහනම්ව සිටි කාලයට අදාල හිඟ වැටුප් නොගෙවීම සාධාරණ වන්නේ ද? යන්න හා එසේ නොවන්නේ නම් ඔහුට කුමන හෝ සහනයක් හිමිවිය යුතු ද යන්න පිළිබඳව වේ.

ඉල්ලුම්කරු විසින් ගොනුකර ඇති විස්තර ප්‍රකාශ මගින් ඉල්ලුම්කරු සඳහන් කර ඇත්තේ ලංකා විදුලිබල මණ්ඩලයේ පාරිභෝගික සහායකවරයෙකු ලෙස සේවය කර සිටියදී 2008 වසරේදී ඉල්ලුම්කරු සිදුකළායයි කියන සිද්ධීන් කිහිපයක් සම්බන්ධයෙන් වැඩ තහනමකට ලක්කළ බවත්, අනතුරුව ඉල්ලුම්කරුට එරෙහිව චෝදනා හයකින් යුත් චෝදනා පත්‍රයක් ඉදිරිපත් කළ බවත්ය. එකී චෝදනා සම්බන්ධයෙන් පැවැත්වූ විධිමත් විනය පරීක්ෂණයකින් එම චෝදනා හය සැකයෙන් තොරව ඔප්පුවී නොමැති බව තීරණය කර ඉල්ලුම්කරු නැවත සේවයේ පිහිටුවන ලෙස නියම කරන ලද බවය. ඉල්ලුම්කරු වැඩිදුරටත් ප්‍රකාශකර සිටියේ ඒ අනුව මණ්ඩලය ඉල්ලුම්කරු නැවත සේවයේ පිහිටුවන ලද නමුත් එසේ සේවයේ පිහිටුවීමේදී දඬුවම් දෙකකට යටත් කරන ලද බවය. එකී දඬුවම් නම්, පාරිභෝගික සේවා සහායක 1 පන්තියේ සිට පාරිභෝගික සේවා සහායක II (අ) ඛණ්ඩයට තනතුර සඳහා පහත හෙළීම හා වැඩ තහනම් කරන ලද කාලය සඳහා වැටුප් කිසිවක් නොගෙවීමයි. ඒ මගින් ඉල්ලුම්කරුට අසාධාරණයක් සිදුවී ඇති බව ප්‍රකාශ කරමින් සහන ලබාදෙන ලෙස මෙම අධිකරණයෙන් අයැද ඇත.

වගඋත්තරකාර විදුලිබල මණ්ඩලය සිය විස්තර ප්‍රකාශ මගින් සඳහන් කර ඇත්තේ ඉල්ලුම්කරු කේ. කේ. යූ. අයි. පෙරේරා නම් පාරිභෝගික මහතාගේ නිවසේ මනු කවරය වෙනස්කර ව්‍යාජ මුද්‍රා තැබීමක් සිදුකර ඔහුගෙන් රුපියල් 4500/- ක මුදලක් ලබා ගැනීමක් කර ඇති බවත්, ඒ විදුලි ඉංජිනේරුවරයාට කරන ලද එකී පැමිණිල්ල අත්හැර දමන ලෙස එම පාරිභෝගික මහතාට මරණීය තර්ජන කර ඇති බවත්ය. එසේම ඉල්ලුම්කරු ජේ. ඒ. ඩී. එන්. මාරඹේ නමැති පාරිභෝගික මහතාගේ නිවසේ හානි වී තිබූ මනුව සම්බන්ධයෙන් මණ්ඩලයට ගෙවීමට නියමිතව තිබූ රු. 5000/- ක මුදල සඳහා ගෙවීම් වවුචරයක් නිකුත් නොකර රු. 3000/ ක මුදලක් ලබා ගැනීම තවත් චෝදනාවක් විය. එම චෝදනා සම්බන්ධයෙන් මණ්ඩලය මූලික විමර්ශනයක් සිදුකරන ලද බවත්, එම විමර්ශනයේදී පැමිණිලි ඉදිරිපත් කළ පාරිභෝගික

මහතෙකු හා ඔහුගේ බිරිඳ ඉංජිනේරුවරයාගේ කාර්යාලයේදී පැමිණිල්ලට අදාළ සිද්ධිය කලේ ඉල්ලුම්කරු බව හඳුනාගත් බවය. විධිමත් විනය පරීක්ෂණයෙන් පසු ඉදිරිපත් කර ඇති වාර්තාවේ සඳහන් කර ඇත්තේ විනිශ්චය සභාව හමුවට එම සිද්ධිය කරන ලද පැමිණිලිකාර පාරිභෝගික මහතුන් නොපැමිණීම හේතු කරගෙන ඉල්ලුම්කරුට එරෙහිව නගා ඇති චෝදනා සැකයෙන් තොරව ඔප්පු වී නොමැති නිසා ඉල්ලුම්කරු නැවත සේවයේ පිහිටුවන ලෙසය. ඒ අනුව මණ්ඩලය විත්තිකරු නැවත සේවයේ පිහිටුවන ලද නමුත් විධිමත් විනය පරීක්ෂණ තීරණ සියල්ලම හෝ කිහිපයක් හෝ එකක් ප්‍රතික්ෂේප කිරීමේ බලය විනය බලධාරියාට තිබෙන නිසාත් ඉල්ලුම්කරුගේ විෂමාචාර ක්‍රියා මූලික පරීක්ෂණ වලින් හෙළිදරව් වී ඇති නිසාත් ඉල්ලුම්කරුට දඬුවම් දෙකක් ලබාදුන් බවය. ඒ අනුව ඉල්ලුම්කරුට කිසිදු අසාධාරණයක් සිදුවී නැති බැවින් ඉල්ලුම්කරුගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කරන ලෙස සිය විස්තර ප්‍රකාශ මගින් වගඋත්තරකාර මණ්ඩලය ඉල්ලා ඇත.

දෙපාර්ශවය අතර ඇතිවී ඇති ආරාවුල බේරුම්කිරීමෙන් නිරාකරණය කිරීමට හැකියාවක් ඇත්දැයි විමසා බැලූවිට එසේ බේරුම් කිරීමට හැකි තත්වයක් නොතිබූ නිසා සාක්ෂි විමසීමට තීරණය කළෙමි. ඒ අනුව 2014.02.07 වන දින ඉල්ලුම්කරු වෙනුවෙන් නියෝජිත ශ්‍රේෂන් සිල්වා මහතාද, විදුලිබල මණ්ඩලය වෙනුවෙන් නීතිඥ සුජිත් පෙරේරා මහතාද පෙනී සිටියදී ඉල්ලුම්කරුගේ මූලික සාක්ෂි ලබා ගැනීම ආරම්භ කරන ලදී. ඉල්ලුම්කරු සාක්ෂි දෙමින් ප්‍රකාශ කලේ 1986.03.03 වන දින තමන් විදුලිබල මණ්ඩලයේ පාරිභෝගික සහකාර තනතුරට පත්වූ බවය. ඒ බව සනාථ කිරීම සඳහා පත්වීම් ලිපිය ඒ 1 ලෙස ලකුණු කර ඉදිරිපත් කරන ලදී. 2008 වසර වනවිට ඉල්ලුම්කරු ශ්‍රී ජයවර්ධනපුර විදුලි ඉංජිනේරු කාර්යාලයේ සේවය කරමින් සිටින විට 2008.08.12 වන දින තමා වැඩ තහනමකට ලක්කළ බව ඉල්ලුම්කරු ප්‍රකාශ කලේය. එම වැඩ තහනම් කිරීමේ ලිපිය ඒ2 ලෙස ලකුණු කර ඉදිරිපත් කරන ලද අතර වැඩ තහනමට ලක්ව සිටින කාලයේදී කිසිදු දීමනාවක් හෝ වැටුපක් නොගෙවන බව එම ලිපියේ සඳහන් වූ බව ප්‍රකාශ කළ ඉල්ලුම්කරු ඊට අදාළ එම කොටස ඒ2 ලෙස ලකුණු කරන ලදී.

අනතුරුව විදුලිබල මණ්ඩලය තමාට චෝදනා හයකින් යුත් චෝදනා පත්‍රයක් ලබාදී චෝදනා සම්බන්ධයෙන් විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වූ බවත් ප්‍රකාශ කළ ඉල්ලුම්කරු එකී විනය පරීක්ෂණයේ ප්‍රතිඵල දැන්වීමේ 2009.10.15 දාතමින් යුත් ලිපිය ඒ3 ලෙස ලකුණු කර ඉදිරිපත් කරන ලදී. විනය පරීක්ෂණයේ නිර්දේශ අනුව තමා වහාම ක්‍රියාත්මක වන පරිදි නැවත සේවයේ පිහිටුවන ලද නමුත් දඬුවම් දෙකක් එනම් තනතුරින් පහත හෙළීම හා වැඩ තහනම් කර සිටි කාලය සඳහා වැටුප් නොගෙවීමට තීරණය කල බව ඉල්ලුම්කරු සිය මූලික සාක්ෂියේදී ප්‍රකාශ කළේය. ඉල්ලුම්කරු 2009.11.18 දාතමින් විනය අභියාචන මණ්ඩලයට අභියාචනයක් ඉදිරිපත් කරමින් තමා වෙත ලබාදී ඇති දඬුවම ඉවත් කරන ලෙස ඉල්ලා ඇත. විනය පරීක්ෂණයේදී ඉල්ලුම්කරුට සිදුව ඇතැයි කියන බලවත් අසාධාරණකම් කිහිපයක්ද ඉල්ලුම්කරු එම අභියාචනා ලිපියේ සඳහන් කර ඇත. එම අභියාචනා ලිපිය ඒ4 ලෙස ලකුණුකර ඉදිරිපත් කරන ලද අතර දී ඇති දඬුවම්වල වෙනසක් සිදුකළ නොහැකි බවට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී විසින් 2010.07.09 දින එවන ලද ලිපිය ඒ5 ලෙස ලකුණු කර ඉදිරිපත් කරන ලදී. ඉල්ලුම්කරු වැඩිදුරටත් සාක්ෂි දෙමින් ප්‍රකාශ කළේ වැඩ තහනමට ලක්ව සිටි අවුරුද්දකුත් මාස අටක කාලයට තමන්ට වැටුප් නොලැබුණු බවය. ඉල්ලුම්කරුගේ 2008 ජූලි මාසයට අදාළ වැටුප් පත්‍රිකාව ඒ6 ලෙස ලකුණු කර ඉදිරිපත් කරන ලදී. ඉල්ලුම්කරු මෙම අධිකරණයෙන් ඉල්ලා සිටින ලද්දේ වැඩ තහනමට ලක්වී සිටි කාලයේ හිඟ වැටුප ලබාදෙන ලෙසත්, වැටුප් තලය පහත හෙළීමට අදාළ හිඟ වැටුප ලබාදෙන ලෙසත්ය.

ඉල්ලුම්කරුගේ මූලික සාක්ෂිය අවසන්වීමෙන් පසු මණ්ඩලය වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරයා ඉල්ලුම්කරුගෙන් හරස් ප්‍රශ්න ඇසීම ආරම්භ කරන ලදී. ඒ අවස්ථාවේදී ඉල්ලුම්කරුට මණ්ඩලය මගින් භාරදෙන ලද චෝදනා පත්‍රය ආර්1 ලෙස ලකුණු කරන ලද අතර, විදුලිබල මණ්ඩලයේ ස්ථාවරය වූයේ ඉල්ලුම්කරුට බාරදෙන ලද චෝදනා ප්‍රතික්ෂේප කරන බව ඉල්ලුම්කරු මණ්ඩලයට දන්වා නැති බවයි.

ප්‍ර: දැන් සාක්ෂිකරු ඒ2 දෙවන ඡේදයේ අවසාන කොටස කියවන්න.

උ: (කියවයි)

ප්‍ර: මෙහෙම තමන්ට ලැබුණ ලිපියේ තියෙනව නේද?

උ: ඔව්

ප්‍ර: තමුන් ඊට පසු ගත්ත පියවර මොකක්ද? ඒ2 ලේඛනයේ අසත්‍ය කියල මණ්ඩලයට කිව්වද?

උ: විනය පරීක්ෂණයේදී ඔය අභූත චෝදනා පිළිගන්නේ නෑ කියල කිව්වා.

ප්‍ර: මම කියන්නේ තමුන්ට චෝදනා පත්‍රයකින් ලොකු චෝදනාවක් කරල තියෙනව. තමුන් ඒ අවස්ථාවේදී එය ප්‍රතික්ෂේප කර නෑ.

උ: මම විනය පරීක්ෂණයේදී ප්‍රතික්ෂේප කළා.

ඒ අනුව ඉල්ලුම්කරුට චෝදනා පත්‍රයක් භාරදුන් පසු එම චෝදනා ප්‍රතික්ෂේප කරන බව ඔහු ලිඛිතව දන්වා නොමැති බව වගඋත්තරකාර පාර්ශවයේ ස්ථාවරය විය.

ඉල්ලුම්කරුට එරෙහිව ඉදිරිපත්වී ඇති පැමිණිලි සම්බන්ධයෙන් මණ්ඩලය මූලික පරීක්ෂණයක් පැවැත්වූ බව ඉල්ලුම්කරු හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් පිළිගත්තේය. මූලික පරීක්ෂණයේදී මූලික පරීක්ෂණයට පැමිණි පැමිණිලිකරුවන් විනය පරීක්ෂණයට නොපැමිණියේ ඉල්ලුම්කරු විසින් ඔවුනට මරණීය තර්ජන එල්ල කර සාක්ෂිදීම වැළැක්වූ බවට කරන ලද යෝජනාව ඉල්ලුම්කරු ප්‍රතික්ෂේප කළේය. ඉල්ලුම්කරුගෙන් හරස් ප්‍රශ්න අසන අවස්ථාවේදී විධිමත් විනය පරීක්ෂණයෙන් පසු ඉල්ලුම්කරු වහාම ක්‍රියාත්මක වන පරිදි සේවයේ පිහිටුවන ලද බව හා දඬුවම් දෙකක් පනවන බව දැක්වෙන ලිපිය ආර්3 ලෙසත්, වැඩ තහනමට ලක්ව සිටි කාලය සඳහා වැටුප් කිසිවක් නොගෙවන බවට වූ එම ලිපියේ සඳහන් කොටස ආර්3(a) ලෙසත් ලකුණු කරන ලදී.

සංස්ථාවේ විශේෂ විමර්ශන අංශය මගින් පවත්වන ලද විමර්ශනයේදී ඉල්ලුම්කරු විසින් ලබාදුන් ප්‍රකාශය ආර්2 ලෙස ලකුණු කර ඉදිරිපත් කරන ලද අතර එම ප්‍රකාශයේ සඳහන් අත්සන තමාගේ බව ඉල්ලුම්කරු පිළිගත්තේය. පැමිණිලි ඉදිරිපත් කළ පුද්ගලයින් ඉංජිනේරුවරයාගේ කාර්යාලයේදී තමන් හඳුනාගත්තාද යන කාරණය සම්බන්ධයෙන් ඉල්ලුම්කරු දුන් පිළිතුර අපැහැදිලි විය. එහෙත් පසුව හරස් ප්‍රශ්ණවලට පිළිතුරු දෙමින් පැමිණිලි ඉදිරිපත් කළ පාරිභෝගිකයින් විසින් තමන් හඳුනාගත් බව ඉල්ලුම්කරු පිළිගත්තේය.

ප්‍ර: සාකච්ඡා කාමරයේ සිටි අයගෙන් තමුන් හඳුනා ගත්තේ කවුද?

උ: මගේ මිතුරාගේ මිතුරා හඳුනා ගත්තා.

ප්‍ර: මිතුරාගේ මිතුරා සාකච්ඡා කාමරයේ ඉඳලා තමුන් හඳුනා ගත්තා.

උ: ඔව්.

ඉල්ලුම්කරුගෙන් හරස් ප්‍රශ්න අසන අවස්ථාවේදී ඔහුගේ සේවා කාලය තුළ ඉල්ලුම්කරු සේවා කොන්දේසි උල්ලංඝනය කිරීම් හා විනය විරෝධී ක්‍රියාවන් කිහිපයකට අදාළ ලේඛන ලකුණු කර ඉදිරිපත් කරන ලදී. ඒ අනුව නොදන්වා නියමිත සේවා මුරයට නොපැමිණීමට අදාළ ලේඛනයක් ආර් 5 ලෙසද, ඉල්ලුම්කරු සම්මුඛ පරීක්ෂණයකට සහභාගි නොවීම නිසා ඉදිරි වැටුප් වර්ධක විලම්භනය කරන බව දැක්වෙන ලිපිය ආර්6 ලෙසද, ඉල්ලුම්කරුගේ සේවය අසතුටුදායක බව සඳහන් ලිපියක් ආර්7 ලෙසද, ලිපියක් අස්ථානගතවීමක් සම්බන්ධයෙන් ඉල්ලුම්කරුට ස්ථාන මාරුවක් ලබාදීමේ ලිපිය ආර්8 ලෙසද, ඉල්ලුම්කරු රත්මලාන විදුලි ඉංජිනේරු කාර්යාලයට අවශ්‍ය නොවන බව දන්වන ලිපිය ආර්9 ලෙසද, ඉල්ලුම්කරු වගකීමකින් තොරව කටයුතු කිරීම නොදන්වා සේවා ස්ථානයෙන් බැහැරව යාමට අදාළ ලිපිය ආර්11 ලෙසද, නොදන්වා රාජකාරි ස්ථානයෙන් පිටත්වයාමක් පිළිබඳ ලිපිය ආර්12 ලෙසද ලකුණු කර ඉදිරිපත් කරන ලදී. එසේම විදුලිබල මණ්ඩලය වෙනුවෙන් සාක්ෂි දුන් පිරිස් කළමනාකාරිවරිය ඉල්ලුම්කරුගේ පුද්ගලික ලිපිගොනුව ඉදිරිපත් කර සාක්ෂි දෙමින් ඉහත සඳහන් ලේඛන ඉල්ලුම්කරුගේ පුද්ගලික ලිපි ගොනුවේ ඇති බව සනාථ කළාය.

ඉල්ලුම්කරුට දී ඇති දඬුවම සාධාරණ ද? නැද්ද? යන්න තීරණය කිරීමේ දී පහත සඳහන් කාරණා සැලකිල්ලට ගන්නා ලදී.

ඉල්ලුම්කරුට එරෙහිව පාරිභෝගිකයින් කිහිපදෙනෙකු පැමිණිලි ඉදිරිපත් කිරීමෙන් පසු වගඋත්තරකාර මණ්ඩලය මගින් ගන්නා ලද ක්‍රියාමාර්ග පිළිබඳව ප්‍රාදේශීය ප්‍රධාන විදුලි ඉංජිනේරු සුදන්ත හේවගේ මහතා සාක්ෂි දෙන ලදී. ඒ මහතා සාක්ෂි දෙමින් ප්‍රකාශ කළේ අලාභ වී තිබූ මනුවක මුහුණත මාරු කිරීම වෙනුවෙන් ඉල්ලුම්කරු මුදලක් ඉල්ලා සිටින ලද බවට පැමිණිල්ලක් ලැබුණ බවය. එම පැමිණිල්ල ලැබුණු පසු අදාළ ස්ථානයට ගොස් පරීක්ෂා කළ බවත්, මුදල් ඉල්ලූ තැනැත්තා පාරිභෝගික මහතා විසින් සිය ජංගම

දුරකථනයේ සටහන් කර තමාට පෙන්වූ බවත් ඉංජිනේරුවරයා සාක්ෂි දෙමින් ප්‍රකාශ කළේය. ඔහු වැඩිදුරටත් සාක්ෂි දෙමින් ප්‍රකාශ කළේ එම පාරිභෝගික මහතා සිය කාර්යාලයට කැඳවූ බවත් ඒ අවස්ථාවේ ඔහු මුදල් ඉල්ලා සිටි පුද්ගලයා ලෙස ඉල්ලුම්කරු හඳුනාගත් බවය. එසේ හඳුනාගත් අවස්ථාවේ ප්‍රධාන ගණකාධිකාරිනිය ද විදුලි අධිකාරි ද සිටි බව ඔහු ප්‍රකාශ කළේය.

ඉල්ලුම්කරුට එරෙහිව පැමිණිලි ලැබුණු පසු ඉල්ලුම්කරුගේ හැසිරීම සම්බන්ධයෙන් ආර් 12 ලෙස ලකුණු කරන ලද ලිපිය වැදගත් වේ. ඉල්ලුම්කරු වෙත යවා ඇති එම ලිපියෙන් දක්වෙන්නේ "ශ්‍රී ජයවර්ධනපුර ශාඛා බල ප්‍රදේශයේ විදුලි සේවා මනුවල අක්‍රමිකතාවයන් හා වංචනික ක්‍රියා පිළිබඳව ඔබට එරෙහිව ලැබී ඇති පැමිණිලි සම්බන්ධව කටයුතු කිරීමේ දී ඔබ විසින් කිසිවෙකුට නොදන්වා කිසිඳු අනුමැතියකින් තොරව කාර්යාලයෙන් පිටව ගොස් ඇත. වහාම සේවයට වාර්තා කරන ලෙස මෙයින් ඔබට දන්වන අතර, එසේ කිරීමට අපොහොසත් වුවහොත් සේවය අතහැර ගියා සේ සලකා ඔබට විරුද්ධව විනයානුකූල පියවර ගැනීමට කටයුතු කරන බව දන්වමි." එයින් පැහැදිලි වන්නේ ඉල්ලුම්කරු පරීක්ෂණවලට මුහුණ නොදී මගහැර සිටීමට උත්සාහ දරා ඇති බවය.

ආර් 13 ලෙස ලකුණු කර ඉදිරිපත් කරන ලද්දේ ඉල්ලුම්කරුගේ වැඩ තහනම් කරන ලද බව දන්වා 2008.08.12 වැනි දින ඉල්ලුම්කරු වෙත යවන ලද ලිපියයි. එම ලිපියේ ඉල්ලුම්කරුගේ වැඩ තහනම් කිරීමට හේතු වූ කාරණා මොනවාද යන්න සඳහන් කර ඇත. ඉල්ලුම්කරුට එරෙහිව ඉදිරිපත් වී තිබූ මූලික විමර්ශනයක් සිදුකර ඇති අතර එම විමර්ශන වාර්තාවේ සඳහන් කර ඇත්තේ ඉදිරිපත් වී ඇති පැමිණිලිවල සඳහන් ක්‍රියාවලට ඉල්ලුම්කරු වගකිව යුතු බවත් ඔහු සම්බන්ධයෙන් විනය ක්‍රියා මාර්ගයක් ගැනීම සුදුසු යැයි නිර්දේශ කරන බවත්ය.

විධිමත් විනය පරීක්ෂණය පවත්වා ඇත්තේ ඉන් අනතුරුවය. එම විනය පරීක්ෂණයෙන් පසු ඉදිරිපත් කර ඇති වාර්තාව මෙම නඩුවට ගොනු කර ඇත. එකී වාර්තාවේ 15 වැනි පිටුවේ මෙසේ සඳහන් කර ඇත. "කෙසේ වුවද ඉහතින් දක්වූ කරුණු ද විධිමත් විනය පරීක්ෂණයේ දී පැමිණිල්ල වෙනුවෙන් සාක්ෂිදීම සඳහා කැඳවා තිබූ පැමිණිලිකරුවන් තිදෙනා කිසියම් බලපෑමක් මත සාක්ෂි දීමට නොපැමිණි නිසා ද, පැමිණිල්ලේ සහ විත්තියේ සැලකිරීම් ඉදිරිපත් කිරීමට දින 21 කල් දී තිබියදී හිතාමතාම ඉදිරිපත් නොකිරීමෙන් ද සිදුවී ඇති බරපතල අඩුපාඩු මැද විනිශ්චය සභාව ඉදිරියේ තබන ලද ලිඛිත සහ වාචික සාක්ෂි ද ඒවා තුළින් පැන නැගී ඇති කරුණු සහ අනියම් සාක්ෂි ද, චූදිතගේ ලිඛිත ප්‍රකාශන ද අධ්‍යයනය කර තීන්දුවක් දීම ගැන සලකා බැලීමි. ඒ අනුව චූදිත පී. පී. වැන්දබෝනා මහතාට එරෙහිව නඟන ලද චෝදනා හයම සැකයෙන් තොරව, පැමිණිල්ලේ සාක්ෂිකරුවන් තිදෙනා විනිශ්චය සභාවට හිතාමතාම නොපැමිණීම නිසාම ඔප්පු වී නොමැති බව තීරණය කරමි."

ඒ අනුව චූදිතට එරෙහිව එල්ලකර තිබූ චෝදනා සැකයෙන් තොරව ඔප්පු වී නොමැති බව නිගමනය කිරීමට මූලික හේතුව ලෙස විධිමත් විනය පරීක්ෂණ වාර්තාවේ සඳහන් කර ඇත්තේ පැමිණිලි ඉදිරිපත් කළ අය සාක්ෂිදීම සඳහා නොපැමිණීමය. එසේ වුවද ඉල්ලුම්කරුට එරෙහිව ඉදිරපත් කර තිබූ චෝදනා සම්බන්ධයෙන් සාක්ෂි විග්‍රහයක් එම වාර්තාවේ අඩංගු කර ඇත. පළමු වන චෝදනාව සම්බන්ධයෙන් පහත සඳහන් සටහන යොද ඇත.

"මෙම සාක්ෂි ප්‍රකාශනය තුළින් ඉතා පැහැදිලිව පෙනී යන්නේ චූදිත විසින්, සවිකර තිබූ විදුලි මනුවේ කවරය අනවසරයෙන් වෙනස් කර ව්‍යාජ මුද්‍රා තබා ඇති බවය. (පිටුව 7) "4 වන චෝදනාව සම්බන්ධයෙන් එම වාර්තාවේ මෙසේ සඳහන් කර ඇත." මෙම සාක්ෂි ප්‍රකාශන වලින් ඉතා පැහැදිලිව අනාවරණය වී ඇත්තේ චූදිත විසින් 4 වන චෝදනාවේ දක්වා ඇති විෂමාචාර ක්‍රියාවන් සිදුකර ඇති බවය. (පිටුව 12).

ඒ අනුව විධිමත් විනය පරීක්ෂණ වාර්තාවේ ඉල්ලුම්කරු සම්බන්ධයෙන් සඳහන් කර ඇති ඉහත සඳහන් කරුණු ද, මණ්ඩලය මගින් ඉල්ලුම්කරුට එරෙහිව පවත්වා ඇති මූලික විමර්ශන වාර්තාවේ සඳහන් කර ඇති කරුණු ද, ඉල්ලුම්කරුගෙන් හරස් ප්‍රශ්න අසන අවස්ථාවේ දී සලකුණු කරන ලද ආර්5, ආර්6, ආර්7, ආර්8, ආර්9, ආර්11 සහ ආර්12 යන ලේඛනවල සඳහන් ඉල්ලුම්කරුගේ සේවා කාලය තුළ විනය විරෝධී ක්‍රියා කලාපයන් පිළිබඳව ද අවධානය යොමු කළෙමි. තවද විනිශ්චය සභාවේ නිගමන සියල්ල හෝ ඉන් කවරක් හෝ පිළිගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට නැතහොත් ප්‍රතිශෝධනය කිරීමට විනය බලධාරයාට බලය ඇති බව ල.වි.ම. විනය සංග්‍රහය පරීක්ෂා කිරීමේ දී පෙනී යයි. ඒ අනුව ඉල්ලුම්කරු නැවත සේවයට පිහිටුවීමට තීරණය කරමින් ඊට අමතරව දඬුවම් දෙකක් ලබාදීමට කර ඇති තීරණය සාධාරණ බව තීරණය කරමි. ඒ අනුව ඉල්ලුම්කරුගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කරන අතර ඉල්ලුම්කරුට කිසිඳු සහනයක් ප්‍රදනය නොකිරීමට තීරණය කරමි.

බේරුම්කරු.

2019 මාර්තු මස 29 වැනි දින.

05 - 604

මගේ අංකය: IR/COM/02/Z/2016/22.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2018.01.04 දිනැති හා අංක 2052/20 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2017.12.26 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් ඇල්පිටිය, තල්ගස්පේ, කැටන්දොළ හි පදිංචි ඩී. ඩී. ත්‍රිමාවිතාන මයා හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 15, රොක්හවුස් පටුමග හි පිහිටි ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2019.04.03 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 මැයි මස 06 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**කාර්මික අධිකරණයේ දී ය.**

ඩී. ඩී. ත්‍රිමාවිතාන මයා,
කැටන්දොළ,
තල්ගස්පේ,
ඇල්පිටිය.

නඩු අංකය : ඒ/03/2018

සහ

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව,
රොක්හවුස් පටුමග,
කොළඹ 15.

අතර කාර්මික ආරාවුල

**ප්‍රදානයයි**

1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් පැවරී ඇති බලතල අනුව ඉහත නම් සඳහන් පාර්ශවකරුවන් අතර ඇති කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා කම්කරු හා කම්කරු සබඳතා ඇමතිවරයා විසින් 2017.12.26 වැනි දින මා වෙත යොමුකර ඇත.

කම්කරු කොමසාරිස් විසින් 2017.11.11 දින මෙම නඩුවට ගොනුකර ඇති IR/COM/02/Z/2016/22 දරන ලිපිය අනුව ඉහත සඳහන් පාර්ශවයන් අතර කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ "ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව විසින් විදුලි අධිකාරි තනතුරට අදළ වැටුප් පරිමාණය ආයතනයේ අනෙකුත් විදුලි අධිකාරිවරුන්ට ලබාදී තිබිය දී විදුලි අධිකාරි ඩී. ඩී. ත්‍රිමාවිතාන යන අයට ලබා නොදීමෙන් ඔහුට යම් අසාධාරණයක් සිදුවී තිබේද යන්න හා එසේ වන්නේ නම් ඔහුට ලැබිය යුතු සහන කවරේ ද යන්න පිළිබඳව වේ."

ඉල්ලුම්කරු විසින් 2018.02.15 දින තොරතුරු ප්‍රකාශයක් ඉදිරිපත් කරමින් ප්‍රකාශ කර ඇත්තේ, ඉල්ලුම්කරු 1991.12.19 වැනි දින ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ ලිපිකරු තනතුරට පත් කළ බවත් 2008.06.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ප්‍රධාන ලිපිකරු තනතුරට පත්වූ බවත්ය. එම තොරතුරු ප්‍රකාශයේ වැඩිදුරටත් සඳහන් කර ඇත්තේ ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ ඇතිවූ එකඟතාවය අනුව 2011.04.11 දින සිට ඉල්ලුම්කරු විදුලි අධිකාරී තනතුරට පත්කරන ලද බවයි. සංස්ථාවේ විදුලි අධිකාරී තනතුරක් දරන ඩබ්. පී. වික්‍රම මහතාගේ වැටුප එම තනතුරට අදළව සකස් කර ඇතත්, ඉල්ලුම්කරුගේ වැටුප විදුලි අධිකාරී තනතුරට අදළව සකස් කර නොතිබීමෙන් වෙනස්කමක් සිදුවී ඇති බවයි. ඉල්ලුම්කරු මෙම අධිකරණයෙන් ඉල්ලා ඇත්තේ, විදුලි අධිකාරී තනතුරට නියමිත වැටුප් තලයේ පිහිටුවන ලෙසය.

ධීවර වරාය නීතිගත සංස්ථාවේ සභාපතිවරයා විසින් මෙම නඩුවට ගොනු කර ඇති විස්තර ප්‍රකාශයේ සඳහන් කර ඇත්තේ 2010 වර්ෂයේ දී ඉල්ලුම්කරු ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ අංක SC01/2010 නඩුව පවරා තිබූ බවත්, ඉල්ලුම්කරු හා ධීවර වරාය නීතිගත සංස්ථාව අතර පැවති එම නඩුව සමථයට පත්කර ගන්නා ලද බවත්ය. එම නඩුවෙහි එකඟත්වය වූයේ ඉල්ලුම්කරු 2008.06.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ප්‍රධාන ලිපිකරු තනතුරේ පිහිටුවීමටත් 2011.04.01 දින සිට විදුලි අධිකාරී III ශ්‍රේණියේ පිහිටුවීමටත් ය. එකී සමථය අනුව සංස්ථාවේ සභාපතිවරයා විසින් නිකුත් කළ CFHC/HR/2011/1182 දරන ලිපිය මගින් ඉල්ලුම්කරු 2011.04.01 දින සිට විදුලි අධිකාරී තනතුරේ රුපියල් 21,225/- ක වැටුප් තලයේ පිහිටුවන ලද බවය. ඉහත කරුණු සනාථ කිරීම සඳහා නියෝගයේ පිටපතක් X1 ලෙසද, දෙවන කරුණ සනාථ කිරීම සඳහා අදාළ ලිපියේ පිටපතක් X2 ලෙස ද ලකුණු කර ඉදිරිපත් කරන ලදී. එම තොරතුරු ප්‍රකාශයේ වැඩිදුරටත් සඳහන් කර ඇත්තේ ඉල්ලුම්කරු ඒ වනවිටත් නිවැරදි වැටුප් තලයේ පිහිටුවා ඇති බවය. කෙසේ වුවද ඉල්ලුම්කරු 2018.03.15 වැනි දින පිළිතුරු ලිපියක් ගොනු කරමින් සංස්ථාව විසින් ඉදිරිපත් කර ඇති සමහර කරුණු ප්‍රතික්ෂේප කර ඇත.

දෙපාර්ශවය අතර සමථයක් ඇති කර ගැනීමේ හැකියාවක් නොතිබුණ බැවින් 2018.09.21 දින මෙම නඩුව විභාගයට ගන්නා ලදී. එදින ඉල්ලුම්කරු සාක්ෂි දෙමින් ප්‍රකාශ කළේ 1991.12.19 දින ලිපිකරු II ශ්‍රේණියේ තනතුරක් හිමිවූ බවත් 2012.04.01 වැනි දින සිට විදුලි අධිකාරී තනතුර හිමිවූ බවත්ය. සංස්ථාව ඉල්ලුම්කරුට ප්‍රධාන ලිපිකරු තනතුර ලබා නොදුන් නිසා ශ්‍රේෂ්ඨාධිකරණයට නඩුවක් ගොනු කළ බවත්, ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ දෙපාර්ශවය අතර ඇති වූ සමථය අනුව ඉල්ලුම්කරුට ප්‍රධාන ලිපිකරු තනතුර ලැබුණු බවත්ය. ඊට අදළ ලේඛන A1 ලෙස හා A1 (a) ලෙස ලකුණු කරන ලදී. ඉන්පසු 2011.04.11 දින සිට ඉල්ලුම්කරුට විදුලි අධිකාරී තනතුරක් හිමිවූ බවත්, ඊට අදළ වැටුප් ලබාදීමට සංස්ථාව පියවර නොගත් බවත්ය. මේ සම්බන්ධයෙන් 2015.11.28 දින සංස්ථාවේ සභාපතිවරයාට ලිපියක් ඉදිරිපත් කළ බව ප්‍රකාශ කළ අතර, එකී ලිපිය A3 ලෙස ලකුණු කිරීමට අවසර ඉල්ලා සිටින ලදී. එම කරුණු සම්බන්ධයෙන් කිහිපවිටක්ම සංස්ථාවේ සභාපතිවරයා වෙත ඉල්ලීම් කළ ද ප්‍රතිචාරයක් නොලැබුණු නිසා කොළඹ උතුර කම්කරු කාර්යාලයට පැමිණිල්ලක් කළ බවත් ඉල්ලුම්කරු ප්‍රකාශ කළේය. ඊට අදළ 2016.02.07 දින ලිපිය A4 ලෙස ඉදිරිපත් කරන ලදී. ඉල්ලුම්කරුගේ ඉල්ලීම සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්වූ සහකාර කම්කරු කොමසාරිස්වරයා ඉල්ලුම්කරුගේ නියමිත වැටුප් තලය ලබාදීමට නිර්දේශ කළ බව ඉල්ලුම්කරු ප්‍රකාශ කළේය. ඊට අදළ ලිපිය A5 ලෙස ලකුණු කරන ලදී. එම නිර්දේශ ක්‍රියාත්මක කරන ලෙස සංස්ථාවේ සභාපතිවරයා සංස්ථාවේ මානව සම්පත් අංශයට දැනුම් දුන්න ද මානව සම්පත් අංශය එය ක්‍රියාත්මක නොකළ බව ඉල්ලුම්කරු ප්‍රකාශ කළේය. සභාපතිවරයාගේ නියෝගය A5A ලෙස ලකුණු කිරීමට අවසර ඉල්ලා සිටින ලදී. ඉල්ලුම්කරු වැඩිදුරටත් සාක්ෂි දෙමින් ප්‍රකාශ කළේ තමන්ට සාධාරණයක් ඉෂ්ඨ නොවූ නිසා සහකාර කොමසාරිස්වරයා වෙත නැවත පැමිණිලි කළ බවය. මෙම ආරාවුල විසඳීම සඳහා කාර්මික අධිකරණයට යොමු කරනු ලැබුවේ ඉන් පසුව බව ඉල්ලුම්කරු ප්‍රකාශ කළේය. 2019.01.25 දින වැඩිදුර විභාගය සඳහා මෙම නඩුව කැඳවූ අවස්ථාවේ දී ඉල්ලුම්කාර පාර්ශවය වෙනුවෙන් ප්‍රකාශ කර සිටියේ ඒ වන විට ඉල්ලුම්කරුගේ ඉල්ලීම් ලබාදී ඇති බවය. කෙසේ වෙතත් වගඋත්තරකාර පාර්ශවය වෙනුවෙන් ප්‍රකාශ කර සිටියේ ඒ පිළිබඳව තමන්ට උපදෙස් ලබා දී නොමැති බවය.

2019.03.19 දින මෙම නඩුව වැඩිදුර විභාගය සඳහා කැඳවූ අවස්ථාවේ දී සංස්ථාවේ මානව සම්පත් කළමනාකරු විසින් 2019.01.30 දින CFHC/HR/2019/155 අංක දරන ලිපිය ඉදිරිපත් කළ අතර, එම ලිපියේ සඳහන් වන්නේ කාර්මික අධිකරණයේ පවතින නඩුවට අදළ සහනයන් ඉල්ලුම්කරුට මේ වන විටත් ලබාදී ඇති බවය. එම ලිපියේ සඳහන් කරුණු දෙපාර්ශවය විසින් පිළිගන්නා ලද හෙයින් මෙම නඩුවේ කටයුතු අවසන් කරන ලදී. ඒ අනුව ඉල්ලුම්කරුට මෙම අධිකරණය මගින් සහනයන් ප්‍රදානය කිරීමේ අවශ්‍යතාවයක් නොමැති බව තීරණය කරමි.

බේරුම්කරු.

2019 අප්‍රේල් මස 03 වැනි දින.

05 - 605

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.